(20)

# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ඊඩී/05/67/01/පොදු VIII

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2022.06.07

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්,
ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,
ජාතික පාසල් විදුහල්පතිවරුන්,
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>වාර්ෂික ස්ථාන මාරු වීම් සහ වාර්ෂික ස්ථාන මාරුවීම් නොවන ස්ථාන මාරු වීම් සඳහා ඉල්ලීම් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම - අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>**

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පත් කරන ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථාන මාරු පටිපාටියට අනුකූලව, වාර්ෂිකව නිකුත් කරනු ලබන අභ්‍යන්තර චක්‍රලේඛයක් මගින් වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් කැඳවීම සිදු කරනු ලබයි. ඒ සඳහා පිළිගනු ලැබූ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේ අයදුම්පතක් ද අමාත්‍යාංශය මගින් හඳුන්වා දී ඇත.

02. එම වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත භාවිතා කළ යුත්තේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීම නිවේදනය කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් අදාළ කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම් සඳහා පමණකි. ඒ අනුව තමා යටතේ සිටින කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන වෙනත් සථාන මාරු ඉල්ලීම් සඳහා එම අයදුම් පත්‍රය භාවිතා නොකරන ලෙස මෙයින් දන්වන අතර මෙම විධිවිධාන 2022.06.15 දින සිට අනිවාර්යයෙන්ම අනුගමනය කළ යුතු වේ.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් නොවන ස්ථාන මාරුවීම් සඳහා කරනු ලබන ඉල්ලීම්, අදාළ නිලධාරියා විසින් තම අවශ්‍යතාව පැහැදිළි කරනු ලබන ඉල්ලීම් ලිපියක් ද සමඟ, ආයතන ප්‍රධානියාගේ ලිඛිත නිර්දේශය ද සඳහන් කර අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඒ අනුව 2022.06.15 දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් අමාත්‍යාංශය වෙත යොමු කිරීමේ දී එම ක්‍රියා පිළිවෙත අනුව ඉදිරිපත් කළ යුතුවේ.

04. තවද වාර්ෂික ස්ථාන මාරුවීම් මෙන්ම වාර්ෂික නොවන ස්ථාන මාරුවීම් සඳහා ද තමා යටතේ සිටින කාර්ය මණ්ඩලය විසින් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධ තීරණය කරනු ලබන අවසාන බලධාරියා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වන හෙයින් එම සියළුම ඉල්ලීම් ආයතනික අවශ්‍යතා අනුව පරීක්ෂා කිරීමෙන් අනතුරුව පැහැදිළි නිර්දේශය සහිතව අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීම සියළුම ආයතන ප්‍රධානීන්ගේ වගකීම වන බව ද මෙයින් දන්වා සිටිමි.

ආර්.කේ. ගන්කේවල
අතිරේක ලේකම් (අනධ්‍යයන හා ඒකාබද්ධ සේවා)
ලේකම් වෙනුවට

පිටපත් -
01. සියළුම අතිරේක ලේකම්වරු
02. සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
03. ප්‍රධාන මූල්‍ය නිලධාරි
04. අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
05. ජාතික පාසල් අධ්‍යක්ෂ
06. විද්‍යාපීඨ කොමසාරිස්